// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2422/38 - 2025 පෙබරවාරි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2025.02.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 6/2017

**2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත**

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6, 8, සහ 31 වන වගන්ති සමග කියවිය යුතු එම පනතේ 117 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඪ) සහ (ණ) වන ඡේද යටතේ ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

බිමල් නිරෝෂන් රත්නායක,
ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ
සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2025 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

01. මේ නියෝග 2025 අංක 01 දරන සිවිල් ගුවන් සේවා (ගගන යාත්‍රාංගන පහසුකම් සඳහා ගාස්තු පැනවීම) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව මෙහි උපලේඛනයේ (II) වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති ගගන යාත්‍රාංගනවල ගගන නාවික සේවා සැපයීමේ නිරතව සිටින එම උපලේඛනයේ (I) වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති සේවා සැපයුම්කරු විසින් එකී ගගන යාත්‍රාංගන සහ එකී ගගන යාත්‍රාංගනවලට ආබද්ධ ඉඩම් භාවිත කිරීම වෙනුවෙන් එම උපලේඛනයේ (III) වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුවක් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජෙනරාල් වරයා වෙත ගෙවනු ලැබිය යුතුය.

1A - PG 7021 — 374 (2025/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. මේ නියෝග වල කාර්ය සඳහා -

"ගගන යාත්‍රාංගන" යන්නට, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 124 වන වගන්තියේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ගගන නාවික සේවා" යන්නෙන්, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 31 වන වගන්තිය යටතේ සඳහන් කරන ලද සේවා අදහස් වේ;

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 11 වන වගන්තිය යටතේ පත් කරනු ලබන සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ; සහ

"සේවා සැපයුම්කරු" යන්නෙන්, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6(3) වන වගන්තිය යටතේ පත් කරනු ලබන ව්‍යවස්ථාදායී සේවා සැපයුම්කරු අදහස් වේ.

**උපලේඛනය**

| *(I) වන තීරුව*<br>*සේවා සැපයුම්කරු* | *(II) වන තීරුව*<br>*ගගන යාත්‍රාංගන* | *(III) වන තීරුව*<br>*ගාස්තුව* |
|---|---|---|
| සී/ස ගුවන්තොටුපොල හා ගුවන් සේවා පුද්ගලික සමාගම | 1. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, කටුනායක<br>2. රත්මලාන ජාත්‍යන්තර ගුවන් තොටුපල<br>3. යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපල<br>4. මඩකලපුව ජාත්‍යන්තර ගුවන් තොටුපල | සෑම වර්ෂ පහකට වරක්ම සියයට දහයකින් (10%) වැඩි වන ලෙස සංශෝධනය විය යුතු වන එක් එක් ගුවන් තොටුපලකට ආබද්ධ ඉඩමක එක් හෙක්ටයාරයකට රුපියල් පනස්දහස (රු. 50000.00) බැගින් වූ වාර්ෂික ගාස්තුවක් |

EOG 02 - 0055

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.